## දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව
## කොළඹ දිස්ත්‍රික්කය

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයෙ මූල්‍ය ප්‍රකාශන, 2011 අප්‍රේල් 04 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දෙහිවල ගල්කිස්ස මහා නගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට දෙහිවල-ගල්කිස්ස මහා නගර සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළයෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශන සමග අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති හෙළිදරව් කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ගිණුම් වල දක්නට තිබුණු ගිණුම්කරණ අඩුපාඩු ආදායම්, වියදම්, වත්කම් හා වගකීම් වශයෙන් අවස්ථාවන් ගණන හා වටිනාකම් පහත වගුවෙහි දැක්වේ.

**ගිණුම් වලට ඇති ව බලපෑම**

| | කාරණය | ආදායම් | | වියදම් | | වත්කම් | | වගකීම් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම | අවස්ථා ගණන | වටිනාකම |
| | | | රු. | | රු. | | රු. | | රු. |
| (i) | ගිණුම්වල වැඩියෙන් දැක්වීම් | 02 | 1,064,820 | 01 | 581,703 | - | - | - | - |
| (ii) | ගිණුම්වල අඩුවෙන් දැක්වීම් | 02 | 1,095,218 | - | - | 01 | 430,548 | 01 | 3,417,958 |
| (iii) | ගිණුම්වලින් අත්හැරීම් | 01 | 1,424,551 | 01 | 4,602,690 | - | - | 01 | 423,637 |
| (iv) | වර්ගීකරණ දෝෂ | 01 | 209,970 | - | - | - | - | - | - |

(ආ) එල්ජීඩී/ටීආර්/2/25 දරන මහා නගර සභා සඳහා වූ ගිණුම් සංග්‍රහයේ දක්වා ඇති ආකෘතියට අනුව ඉඩම් හැර අනෙකුත් සියළුම වත්කම් පිළිබඳ විස්තර ඇතුළත් කර වෙනම උපලේඛන පිළියෙල කොට ශේෂ පත්‍රය සමග ඉදිරිපත් කළයුතු වුවද, කාර්යාල උපකරණ සහ ගොඩනැගිලි සම්බන්ධයෙන් විස්තර ඇතුළත් උපලේඛන පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

### 1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු.561,745,235 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාල ශේෂයන් ඒවාට අදාල උපයෝගී ලේඛන හා වාර්තා වල දැක්වෙන ශේෂයන් සමග සැසඳීමේදී වෙනසකම් නිරීක්ෂණය වූ අතර, වෙනස්කම් වල එකතුව රු.6,726,729 ක් විය.

### 1.3.4 ගෙවිය යුතු ගිණුම්

සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට,

(i) ණයහිමි ශේෂවල එකතුව රු.76,362,675 ක් වූ අතර, එකතුව රු.28,395,877 ක් අවුරුදු 03 ක කාලයක් ඉක්මවා තිබුණි.

(ii) ආපසු ගෙවියයුතු තැන්පතු ශේෂ වල එකතුව රු.35,651,536 ක් වූ අතර, පිළිවෙලින් රු.2,172,100 ක් වූ හා රු.258,750 ක් වූ ආදායම් තැන්පතු සහ ටෙන්ඩර් තැන්පතු ශේෂ 2002 වර්ෂයේ සිට නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් තිබුණි. තවද, රු.30,704,571 ක් වූ විවිධ තැන්පතු ශේෂයෙන් රු.19,759,231 ක් වර්ෂ 03 සිට වර්ෂ 18 ක් අතර කාල පරාසයකට අයත් වූ අතර, විශ්‍රාම වැටුප් තැන්පතු ශේෂය

රු.1,115,531 ක් වු අතර, ඉන් රු.188,849 ක් වු ශේෂ 1986 ත් 2007 ත් අතර කාල පරාසයට අයත් වු ඒවා විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) පිළිතුරු නොලත් විගණන විමසුම්**

(i) සමාලෝචිත වර්ෂය සඳහා නිකුත් කරන ලද විගණන විමසුම් වලන් 15 ක් සඳහා 2011 සැප්තැම්බර් 12 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම් වලට භාජනය වු ගණනය කල හැකි ගනුදෙනු වල වටිනාකම රු.36,222,542 ක් විය.

(ii) ඉකුත් වර්ෂ 02 තුල නිකුත් කරන ලද විමසුම් වලින් 05 කටද, 2011 සැප්තැම්බර් 12 දින වන විටත් පිළිතුරු සපයා නොතිබුණි.

**(ආ) තොරතුරු විගණනයට ඉදිරිපත් නොකරීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.420,957,088 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට අනුකුල නොවීම

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තිරණවලට යොමුව | අනුකුල නොවීම් |
|---|---|
| **(අ) මහා නගර සභා ආඥාපනත (252 අධිකාරිය)** | |
| 218 වැනි වගන්තිය | එක් එක් වර්ෂය සඳහා සභාවේ පරිපාලනය පිළිබඳ වාර්තාවක්, මුල්‍ය ප්‍රකාශන සමඟ මුදල් වර්ෂය |

ඉක්මවූ පසුව හැකි ඉක්මනින් සභාව වෙත ඉදිරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පරිපාලනය පිළිබඳ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| (i) | මු.රෙ.210(i) හා (ii) | - වට්ටම් වාසි ලබාගත හැකි වන පරිදි ජල බිලපත් නිරවුල් නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුල රු.38,201 ක වට්ටම් වාසි අහිමිවී තිබුණි.<br>- ජල බිල්පත් ප්‍රමාද වී නිරවුල් කිරීම හේතුවෙන් රු.7,105 ක ප්‍රමාද ගාස්තුවක් සහ සේවා විසංධි කිරීම් සංධි කිරීම සඳහා රු.26,880 ක ගාස්තුවක්ද ගෙවීමට සදුවී තිබුණි. |
| (ii) | මු.රෙ.371(2) | විවිධ කාර්යයන් සඳහා නිලධාරීන්ට සහ ආයතනවලට අත්තිකාරම් ලබාදීමේදී හා නිරවුල් කිරීමේදී යොමුගත විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි. 2010 දෙසැම්බර් 31 දිනට නොපියවූ අත්තිකාරම් ශේෂ වල එකතුව රු.775,203 ක් විය. |

**(ඇ) චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| (i) | 1997 පෙබරවාරි 03 දිනැති අංක 8/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 1997 පෙබරවාරි 19 දිනැති අංක එල්/ජී/9/97 දරන ප්‍රධාන ලේකම් (බ.ප.) ගේ චක්‍රලේඛය | මාසයකට පැය 80 ඉක්මවා අතිකාල දීමනා ගෙවීම සඳහා අදාල අංශ/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශ මත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. එසේවුවද, එවැනි අනුමැතියක් ලබානොගෙන සමාලෝචිත වර්ෂයේදී පැය 80 සිට පැය 200 දක්වා කාලයන් වෙනුවෙන් අතිකාල දීමනා ගෙවා තිබුණි. |
| (ii) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2009 ජුලි 20 දිනැති අංක එල්ජීඩී/02/23/01/01/01 | වේලාව පදනම් කරගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නා විට එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මගින් සනාථ කර ගත යුතු වුවද, පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා |

| | | |
|---|---|---|
| | දරන බස්නාහිර පළාත් පාලන කොමසාරිස් ගේ චක්‍රලේඛය | එකී යන්ත්‍ර භාවිතා නොකර ගෙවීම් කර තිබුණි. |
| (iii) | 1976 නොවැම්බර් 29 දිනැති අංක 829 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සියළුම සේවකයින්ට අතිකාල දීමනා ගෙවීම් කිරීම සඳහා පොදු 35(අ) දරන ආකෘතිය භාවිතා කල යුතු වුවත්, සභාව විසින් ඊට අනුකූල වී නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.36,966,222 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.226,667,836 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

#### 2.2.1 බැංකු මුදල්

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2001 සහ 2008 අතර වර්ෂ වල නිකුත් කර තිබුණු නමුත් ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකරන ලද එකතුව රු.2,338,497 ක් වූ චෙක්පත් 375 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 ප්‍රකාර කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන වල විවිධ තැන්පතු යටතේ ගිණුම් ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව, ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 කට වැඩි කාලයක් ඉක්මවූ එකතුව රු.153,178 ක් වූ චෙක්පත් 60 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබුණි.

(ඇ) එකතුව රු.186,721 ක් වූ අහරු චෙක්පත් 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 189 හා 486 හි විධිවිධාන ප්‍රකාර කටයුතු කර නොතිබණි.

### 2.3 ආදායම් පරිපාලනය

## 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තු ගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තු ගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 160,570 | 156,102 | 209,617 | 148,013 | 126,028 | 192,369 |
| බදු කුලී | 15,975 | 15,043 | 7,000 | 2,572 | 12,489 | 2,839 |
| බලපත්‍ර ගාස්තු | 11,760 | 11,967 | 612 | 14,775 | 16,993 | 818 |
| වෙනත් ආදායම් | 205,310 | 205,310 | - | 391,306 | 391,306 | - |

## 2.3.2 වෙළඳ සැල් කුලී

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙහිවල, ගල්කිස්ස, කොහුවල, සරණංකර, කරගම්පිටිය සහ රත්මලාන යන වෙළඳ සංකීර්ණ වල වෙළඳසැල් බදුකරුවන් 259 දෙනෙකුගෙන් 2010 දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,424,365 ක හිඟ ශේෂයන් වු අතර එකී ශේෂය තුල ඉකුත් වර්ෂයේ හිඟ බදු රු.2,346,037 ක ශේෂයක් ඇතුළත් වී තිබුණි. එසේවුවද, බදු ගිවිසුම් වල 17 වැනි හා 19 වැනි කොන්දේසි ප්‍රකාර සභාව විසින් බදුකරුවන්ට එරෙහිව කටයුතු කර නොතිබුණි.

(ආ) ගල්කිස්ස, දෙහිවල සහ සරණංකර යන වෙළඳ සංකීර්ණ වල කුලී ගෙවා නොතිබු කඩකාමර 05 ක් 2006 සහ 2007 යන වර්ෂ වල පවරාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒවායින් හිඟ රු.98,407 ක අයකර ගැනීමට හා ඒවා නැවත බදු දීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) ගල්කිස්ස සහ දෙහිවල යන වෙළඳ සංකීර්ණ වල පිහිටි කඩකාමර 03 ක් සභාව විසින් කුලී අයකිරීමකින් තොරව 2008 අගෝස්තු 05 දින සිට බාහිර පුද්ගලයන් තිදෙනෙකු වෙත ව්‍යාපාර කටයුතු කිරීම සඳහා ලබාදී තිබුණි.

(ඈ) කොහුවල සහ ගල්කිස්ස වෙළඳ සංකීර්ණ වල කඩකාමර 04 ක බදු ගිවිසුම් වල කාලය පිළිවෙලින් 1996 ඔක්තෝබර්, 2004 ජුනි, 2006 ජුනි සහ 2008 ජුනි යන කාල වලදී අවසන් වී තිබුණද, 2011 ජුනි 30 දින වන විටත් නව බදු ගිවිසුම් වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

**2.3.3 ගොඩනැගිලි කුලී**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු දෙහිවල පොලිසිය සහ සරණංකර පොලිස් මුරපොල පවත්වාගෙන යන ගොඩනැගිලි වෙනුවෙන් වර්ෂ 10 කටත් වඩා වැඩි කාලයක සිට කුලී මුදල් ගෙවා නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට හිඟ මුදල් වල එකතුව රු.1,246,448 ක් විය.

(ආ) තවත් ගොඩනැගිලි 13 ක බදුකරුවන්ගෙන් ඉකුත් වර්ෂ අවසානයට රු.901,957 ක් ද, සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,128,163 ක් ද අයවීමට තිබුණි.

**2.3.4 වෙළඳ බලපත්‍ර**

සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබු බලපත්‍ර නිකුත් කල යුතු වෙළඳ සැල් 991 කින්, වෙළඳ සැල් 99 ක් සඳහා පමණක් බලපත්‍ර ලබාදී තිබුණි. ඒ අනුව වෙළඳසැල් 892 ක් බලපත්‍ර ලබා නොගෙන ව්‍යාපාර කටයුතු කර තිබුණි. එසේවුවද, බලපත්‍ර ගාස්තු සඳහා එම ආයතන වලින් මුදල් අයකර ගෙන තිබුණි.

**2.3.5 ව්‍යාපාර බදු**

සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබු ව්‍යාපාර බදු අයකරගත යුතු ආයතන 2,169 කින්, ආයතන 1,883 කින් පමණක් බදු අයකරගෙන තිබුණි. ආයතන 286 කින් බදු අයකර නොතිබු අතර 2010 වර්ෂය අවසානයට හිඟ බදු ශේෂය රු.611,935 ක් විය. සමාලෝචිත වර්ෂයට

අදාල හිඟ බදු අයකර ගැනීමට ආයතන 63 ක් සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ආරම්භ කර තිබුණි.

## 2.4 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම් අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 543,395 | 447,720 | 95,675 | 509,275 | 435,932 | 73,343 |
| අනෙකුත් | 302,939 | 267,237 | 35,702 | 273,319 | 269,926 | 3,393 |
| උප එකතුව | 846,334 | 714,957 | 131,377 | 782,594 | 705,858 | 76,736 |
| ප්‍රාග්ධන වියදම් | 136,179 | 23,138 | 113,041 | 59,202 | 67,054 | (7,852) |
| මුළු එකතුව | 982,513 | 738,095 | 244,418 | 841,796 | 772,912 | 68,884 |

## 2.5 අය වැය පාලනය

වර්ෂය තුලදී ආදායම් හා වියදම් ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද, අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර, සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන තිබූ බවක් නිරීක්ෂණය නොවීය.

## 2.6 අධිභාර

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 226 (1) වගන්තියේ විධිවිධාන යටතේ වගකිව යුතු අයවලුන්ට එරෙහිව මවිසින් පනවන ලද අධිභාර අනුව 2010 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට තිබුණු අධිභාර අගය රු.1,106,576 ක් විය.

(ආ) රු.11,347,473 ක අගයකට අදාල ගනුදෙනු සම්බන්ධයෙන් මවිසින් ඉදිරියේදී අධිභාර පැනවීමට යෝජිතව ඇත.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

### අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| **සේවක ශ්‍රේණිය** | **2010 දෙසැම්බර් 31 දිනට** | |
|---|---|---|
| | **අනුමත** | **තථ්‍ය** |
| මාණ්ඩලික | 30 | 21 |
| ද්විතීය | 240 | 209 |
| ප්‍රාථමික | 1,428 | 1,371 |
| වෙනත් (කොන්ත්‍රාත්,තාවකාලික) | - | 23 |
| | 1,698 | 1,624 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයේදී සේවකයින්/නිලධාරීන් 241 දෙනෙකු දින 6,754 ක වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණි.

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සේවක සංඛ්‍යා සැලැස්මේ අනුමතව තිබුණු නමුත්, එකම සේවකයකු/නිලධාරියකු හෝ නොමැති සේවක කාණ්ඩ 11 ක පවතින පුරප්පාඩු 15 ක් ද, ඇතුළුව සේවක කාණ්ඩ 30 ක පුරප්පාඩු 110 ක් පැවතුණි.

(iii) සේවක කාණ්ඩ 12 ක අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා 16 දෙනෙකුද, අනුමත කාර්ය මණ්ඩලයට අයත් නොවන තනතුරු 03 ක සේවකයින් 08 දෙනෙකුද, සේවයේ යොදවා වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

(iv) ආයතන සංග්‍රහයේ vi වැනි පරිච්ඡේදයේ 2.10 උපජේදයේ දැක්වෙන විධිවිධාන වලට අනුව සභාවේ නිලධාරීන්/සේවකයින් පත් කිරීම්, ස්ථිර කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම්, විශ්‍රාම යැම් /ඉවත් කිරීම්, වැටුප් වර්ධක ලබාදීම්, වැටුප් වර්ධක විලම්බනය කිරීම් සහ වැටුප් පරිවර්තනය කිරීම් යනාදී කාර්ය මණ්ඩල කටයුතු වලට අදාල ලිපිවල පිටපත් විගණකාධිපති වෙත යොමුකර නොතිබුණි.

## 2.8 වත්කම් කළමනාකරණය

### 2.8.1 නිශ්ක්‍රිය භෞතික සම්පත්

නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිතව පැවත භෞතික සම්පත් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විස්තර පහත දැක්වේ.

(අ) වටිනාකම රු.4,991,140 ක් වු ව්න්ච්න් මැෂින් 04 ක් වසර 06 කට වැඩි කාලයක සිටද, වටිනාකම රු.458,600 ක් වු අත්ට්‍රැක්ටර් 04 ක් වසර 03 සිට 04 දක්වා කාලයක සිටද, වටිනාකම රු.9,342,000 ක් ව වීල් බැකෝ යන්ත්‍රයක් වසර 02 ක පමණ කාලයක සිටද, වටිනාකම රු.11,200,000 ක් වු මිනි එක්ස් කැවේටර් යන්ත්‍ර 02 ක් මාස 09 ක පමණ කාලයක සිටද, වටිනාකම රු.4,129,940 ක් වු ස්කිඩ් ස්ටියර් යන්ත්‍ර 02 ක් වසර 02 ක පමණ කාලයක සිටද, වටිනාකම රු.1,625,000 ක් වු මාර්ග තලන යන්ත්‍රයක් ඇතුළුව වටිනාකම ඉදිරිපත් නොකෙරුණු මාර්ග තලන යන්ත්‍ර 02 ක් ද, රියදුරන් නොමැතිවීම මතද නිශ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් රු.387,408 කට සහ රු.258,272 කට මිලදීගෙන තිබුණ ඇඟිලි සලකුණු යන්ත්‍ර 08 ක් සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීමට යොදා නොගෙන නිෂ්ක්‍රීයව තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා පහත් බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් 2005 පෙබරවාරි 18 දින පවරාදී තිබු වටිනාකම රු.1,960,564 ක් වූ ලියවන පට්ටලය ක්‍රියාකරුවෙකු නොමැතිවීම මත වසර පහක සිට නිෂ්කාර්යව පැවතුණි.

### 2.8.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.22,733,200 ක් වූ අතර, ඉන් රු.11,170,474 ක් වු ශේෂ වර්ෂ 1 ත් 3 ත් අතර කාලයක් ද, තවත් රු.1,992,651 ක් වු ශේෂ වසර 04 කට වැඩි කාලයක් ද, ඉක්ම වු ඒවා විය.

### 2.8.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබුණු සේවක ණය හා අත්තිකාරම් ශේෂවල එකතුව රු.133,498,327 ක් වූ අතර, ඉන් එකතුව රු.2,250,966 ක් වු දේපළ, වාහන, ආපදා ණය ශේෂද, එකතුව රු.653,556 ක් වු විශේෂ, උත්සව, වෙනත් අත්තිකාරම් ශේෂද, දීර්ඝ කාලයක් තුල අයනොවී පවතින නමුත්, එම ණය ශේෂ අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද, සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

## 2.8.4 සමීක්ෂණය නොකළ වත්කම්

සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.513,266,168 ක් විය.

## 2.9 වාහන උපයෝජනය

(අ) සභාවේ වාහන සහ යන්ත්‍ර සංඛ්‍යාව 204 ක් වු අතර කුලී පදනම මත වැන්රථ 19 ක් ද සේවය සඳහා යොදවා ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ස්ථිර රියදුරන් නොමැතිවීම හේතුවෙන් රියදුරු බලපත්‍ර හිමි කම්කරු සේවකයින් 34 දෙනෙකු රියදුරන් ලෙස සේවයේ යොදවා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුල වාහන 15 ක් අවස්ථා 17 කදී අනතුරු වලට භාජනය වී තිබුණද, මුදල් රෙගුලාසි මු.රෙ.104 ප්‍රකාර අනතුරු සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා විගණකාධිපති වෙත වාර්තා කර නොතිබුණි.

(iii) මුදල් රෙගුලාසි මු.රෙ. 1647 (ආ) හි විධිවිධාන ප්‍රකාර වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සමීක්ෂණ පැවැත්විය යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(iv) කුලී රථ හිමියන් සමඟ ඇතිකරගෙන තිබුණු ගිවිසුමේ 07 වෙනි කොන්දේසිය ප්‍රකාර දිනකට කි.මී.80 ක සාමාන්‍ය ධාවනයක් කල යුතුව තිබුණද, ඊට වඩා බෙහෙවින් අඩු ධාවනයක් සඳහාද, දිනකට හිමි සම්පුර්ණ දීමනාව ගෙවා තිබුණි.

(ආ) 2005 ජුලි 08 දිනැති අංක 1400/25 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාර නාගරික මන්ත්‍රීවරුන් මාසයකට රු.6,000 ක ඉන්ධන දීමනාවකට හිමිකම් මත දීමනා ලබාගනිමින් සිටියදීත් මන්ත්‍රීවරුන් 18 දෙනෙකු සමාලෝචිත වර්ෂයේ සභාවේ වාහන දෙකක් භාවිතා කර කිලෝමීටර් 11,195 ක් ධාවනයේ යොදවාගෙන

තිබුණද, 1982 මාර්තු 17 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපි අංක : මුදල් 211 හි ප්‍රකාර, දරන ලද වියදම් සහ ඒ මත ගනන් බලන ලද 25% ක අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 2.10 හඳුනාගත් පාඩු හා හානි
-------------------------

එකක් රු.45,000 ක් බැගින් වූ ඇඟිලි සලකුණු යන්ත්‍ර 03 ක් අවිධිමත් ලෙස භාවිතාකිරීමෙන් සම්පූර්ණයෙන්ම විනාශ වීම නිසා රු.135,000 ක් සහ එක් යන්ත්‍රයක් අළුත්වැඩියාව සඳහා රු.16,600 ක්ද වශයෙන් දැරීමට සිදුවීමෙන් සභාවට රු.151,600 ක මූල්‍ය පාඩුවක් සිදුවී තිබුණි.

## 2.11 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැටුප් ප්‍රතිපූර්ණ වලින් නිදහස් නොකර රඳවාගෙන තිබුණු 15% ක ප්‍රමාණය නිදහස් කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදී තිබුණු නිර්නායකයන් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම නිසා, රු.17,205,903 ක රඳවා ගැනීම් නිදහස් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි.

(ආ) අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර තිබුණු මිනින්දෝරු සැලසුම් සහ ගොඩනැගිලි සැලසුම් අයදුම්පත් වලින් පිළිවෙලින් 300 ක් හා 157 ක් සමාලෝචිත වර්ෂයේ අවසානයට ඉතිරිව තිබුණි. එම අයදුම්පත් වලින් මිනින්දෝරු සැලසුම් 71 ක් සහ ගොඩනැගිලි සැලසුම් 28 ක් ඉකුත් වර්ෂයේදී ඉදිරිපත් කර තිබුණු ඒවා විය.

(ඇ) 1971 ජුලි 26 දිනැති අංක 810 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධානවලට අනුව වැටුප් රහිත නිවාඩු එම මාසයේදීම හෝ ඊළඟ මාසයේදී සම්පූර්ණයෙන්ම අයකිරීම වෙනුවට වාරික වලින් අයකර ගැනීමට කටයුතු කර තිබුණි.

(ඈ) 1981 අංක 26 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 10 වෙනි වගන්තිය ප්‍රකාර සේවකයකුගේ මාසික සම්පූර්ණ ඉපයීම් වලින් 8% ක ප්‍රමාණයක් අරමුදලට දායක මුදල් වශයෙන් අයකර යැවීම වෙනුවට, අනුමැතියකින් තොරව 1980 වර්ෂයටත් පෙර සිට සේවකයින්ගේ වැටුපෙන් 9% ක ප්‍රමාණයක් අයකර අරමුදලට බැර කර තිබුණි. අර්ථ සාධක අරමුදල් හිමිකම් ලැබූ සේවකයින් ස්ථිර විශ්‍රාම වැටුප් හිමි සේවකයින් බවට පත්වීමේදී අරමුදලට ගෙවා තිබූ දායක මුදල් නැවත ගෙන්වා ගෙන තිබුණද, සේවකයාගෙන් අයකර ගෙන තිබූ 9% ක දායකයෙන් සේවකයාට 8% ක ප්‍රමාණයක් පමණක් ගෙවා තිබුණි.

## 2.12 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්/අනියම් පදනම් මත සේවයේ යොදවන ලද සේවකයකු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් ලැබූ විට, කොන්ත්‍රාත්/අනියම් කාලයට අදාලව සභාව විසින් සේවා නියුක්තයන්ගේ භාර අරමුදලට ගෙවා තිබූ 3% ක දායක මුදල නැවත සභාවට ගෙන්වා ගත යුතුව තිබුණද, අරමුදල ආරම්භ වූ 1981 වර්ෂයේ සිට 2011 වර්ෂයේ ජුනි දක්වාම ස්ථිර විශ්‍රාම වැටුප් තනතුරු වලට අනුයුක්ත කර තිබූ සේවකයින් වෙනුවෙන් අරමුදලට යවා තිබුණු දායක මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආදාල තනතුරු වල පුරප්පාඩු තිබියදීත් කළමනාකරණ සහකාර, රියදුරු, ආරක්ෂක නියාමක සහ කම්කරු යන තනතුරු වලට අයත් සේවකයින් 05 දෙනෙකු පළාත් සභා ප්‍රධාන ලේකම් කාර්යාලයට මුදාහැර තිබුණි. එකී සේවකයින්ගේ පැමිණීම, නිවාඩු සහ වැටුප් රහිත නිවාඩු පිළිබඳ විස්තර ආදිය ලබා නොගෙන 2010 වර්ෂයේදී වැටුප් සහ දීමනා රු.1,063,914 ක් ගෙවා තිබුණි.

(ඇ) ගිවිසුම්ගත බැඳීමකට එළඹීමකින් තොරව හා කුලී මුදලක් අයකිරීමකින් තොරව පල්ලිය දොර පිහිටි දෙමහල් ගොඩනැගිලි 02 ක් සහ පර්ශ්‍රය දීර්ඝ කාලයක් සිට මුදල් අයකර පාඨමාලා පවත්වාගෙන යාම සඳහා ජාතික තරුණ සේවා සභාවට ලබා දී තිබුණි.

## 2.13 කොන්ත්‍රාත් පරිපාලනය

### 2.13.1 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත වර්ෂයේ සහා බලප්‍රදේශය තුල ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති ගණන | ඇස්තමේන්තු වටිනාකම | ලැබුණු මුදල | වැය කළ මුදල | නිමකළ ව්‍යාපෘති ගණන | නොනිමි ව්‍යාපෘති ගණන | අවලංගු කළ ව්‍යාපෘති |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | | | |
| පළාත් සභා ආධාර ව්‍යාපෘති | 02 | 619,964 | 17,985 | 561,479 | 02 | - | - |
| සභා අරමුදල් ව්‍යාපෘති | 22 | 24,692,829 | - | 17,414,345 | 20 | 01 | 01 |

## 2.13.2 ඉදිකිරීම්

--------

සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් ඉටුකර තිබුණු කර්මාන්ත පිළිබඳව 2010 දෙසැම්බර් 03 හා 07 යන දෙදින කරන ලද ස්ථානීය පරීක්ෂාවලදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගැමුණු මාවතෙහි භූගත පයිප්ප මාර්ගයෙ කොටසක වැඩ 2010 ඔක්තෝබර් 25 දින ආරම්භ කරන ලද නමුත්, කර්මාන්තය අවසන් කිරීමටත් ප්‍රථම හියුම් පයිප්ප පුපුරා ගොස් තිබු බව නිරීක්ෂණය විය.

(ආ) අත්තිඩිය පන්සල පාර ගල් අතුරා තාර දැමීමේ කර්මාන්තය 2010 අගෝස්තු මස අවසන් කර තිබුණද, මාර්ගයෙහි ගල් මතුවී වලවල් හැර් තිබු බව පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඇ) රත්මලාන දුම්රිය පොල පාර වරිපනම් අංක 25/1 සිට 25/6 දක්වා කොටසෙහි භූගත හියුම් පයිප්ප යෙදීමේ කර්මාන්තය සඳහා අගල් 9 ක් උසැති අඩි 8 ක් දිගැති හියුම් පයිප්ප 16 ක් නිකුත් කර තිබුණත්, හියුම් පයිප්ප 10 ක් පමණක් කර්මාන්තය සඳහා යොදා ගෙන තිබුණි. පයිප්ප වලින් 05 ක් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවුණු අතර, එක් පයිප්පයක් එම ස්ථානයේ දමා ගොස් තිබුණි.

(ඈ) බලපොකුණ පුරාණ විහාර පාර තාර දැමීමේ කර්මාන්තයෙහි වැඩ 2010 මැයි 07 දිනට අවසන් කර තිබුණද, මාර්ගයේ ගල් මතු වී වලවල් හැර් තිබුණි.

(ඉ) 2010 ජුනි 10 දිනට කොහුවල ප්‍රිය මාවත තාර දැමීමේ කර්මාන්තයෙහි වැඩ අවසන් කර තිබුණද, මාර්ගය සේදී ගොස් වලවල හැර් තිබුණි.

(ඊ) ගිවිසුම්ගත රු.360,000 මුදල වියදම් කර අත්තිඩිය වාහන සේදුම් ඒකකය අසල ස්ථාන ගත කර තිබුණු භූගත ඉන්ධන ටැංකියෙහි වැඩ අවසන් කර 2011 මැයි 31 දිනට වසර දෙකකට වඩා වැඩි කාලයක් ගත වී තිබුණද, එහි පවතින අඩුපාඩු හේතුවෙන් එය සභාවේ ප්‍රයෝජනය සඳහා යොදවා ගැනීමට නොහැකි වී තිබුණි.

## 2.14 අභ්‍යන්තර විගණනය

--------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 133 (1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතබුණි.

(ආ) මු.රෙ. 134 (1),(2) හා (3) හි දැක්වෙන පරිදි,

(i) ආයතනයේ මුදල් හා පරිපාලන කටයුතු වලින් නිදහස් වු ඒකකයක් ලෙස ක්‍රියා කිරීම,

(ii) අභ්‍යන්තර විගණන වැඩසටහන් විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව සකස් කිරීම,

(iii) අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම

යනාදී කරුණු සම්බන්ධයෙන් යොමුගත විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 2.15 සංයුක්ත සැලැස්ම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ අංක 5 ඡේදය අනුව පහත දැක්වෙන සැලැසුම් සහ වාර්තා සකස් කල යුතුව තිබුණද ඒවා පිළියෙල කර නොතිබුණි.

(අ) අවම වශයෙන් වර්ෂ 3 ක් සඳහා වු සංයුක්ත සැලැස්මක් පිළියෙල කිරීම.

(ආ) සංයුක්ත සැලැස්මට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම.

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හා 402 (i) හි දැක්වෙන උපදෙස් කෙරෙහි අවධානය යොමුකර ක්‍රියාකාරී සැලැස්ම සමඟ සසඳමින් නියමිත දිනයකදී වාර්ෂික කාර්ය සාධන වාර්තා පිළියෙල කර අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම.

## 3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) අභ්‍යන්තර විගණනය
(ඈ) අයවැය පාලනය
(ඉ) ආදායම් පරිපාලනය
(ඊ) වත්කම් කළමනාකරණය
(උ) සේවක මණ්ඩල කළමනාකරණය
(ඌ) ණයගැති, ණයහිමි පාලනය